original

මැතිවරණ කොමිෂන් සභාව
20 JAN 2026

# ව්‍යවස්ථාව

## ජාතික නිදහස් පෙරමුණ

සරත් විජේසිරි
ප්‍රධාන ලේකම්
ජාතික නිදහස් පෙරමුණ
අංක 428/1,
රොබට් ගුණවර්ධන මාවත
බත්තරමුල්ල



2026/01/19

01 වන වගන්තිය

**හැඳින්වීම**

ජාතික නිදහස් පෙරමුණ ශ්‍රී ලංකාවේ ජාතික නිදහස අපේක්ෂා කරන දේශප්‍රේමී ප්‍රගතිශීලීන්ගේ දේශපාලන පක්ෂයයි.

| | |
|---|---|
| නාමය:- | ජාතික නිදහස් පෙරමුණ |
| ධජය:- | පළල මෙන් දෙගුණයක් දිග රන් පැහැති කොඩිය මධ්‍යයේ රතු පැහැති තාරකා පහක සළකුණ |
| ගීතය:- | පක්ෂයේ ගීතය |
| මැතිවරණ සළකුණ :- | පංචායුධය |
| වර්ණය:- | රන් පැහැය |

02 වන වගන්තිය

**සාමාජිකත්වය**

01.) ශ්‍රී ලංකාවේ පුරවැසිකම හිමි, ශ්‍රී ලංකාවේ හා විදේශ වල පදිංචිව සිටින, වයස අවුරුදු 16 සම්පූර්ණ වූ ප්‍රතිපත්ති ප්‍රකාශනයත්, වැඩ පිළිවෙළත් ව්‍යවස්ථා මාලාවත් පිළිගන්නා හා ඒ අනුව ක්‍රියා කිරීමට එකඟ වන, පක්ෂ සාමාජික මුදල් නොකඩවා ගෙවන්නට සූදානම්, පක්ෂයේ සංවිධාන වලට, ශාඛා වලට අඛණ්ඩව හා සක්‍රියව සහභාගී වීමට එකඟ සහ පක්ෂයේ තීරණයන් ක්‍රියාවට නැගීමට සූදානම් අය පක්ෂ සාමාජිකත්වය ලැබීමට සුදුස්සෝ වෙති.

02.) පක්ෂයේ සාමාජිකත්වය ලැබීමට කැමති අය ඒ සඳහා වූ අයදුම්පත පුරවා පක්ෂ ශාඛාවට භාරදිය යුතුය. ශාඛා සැසිවාර වලදී එවැනි අයදුම්පත් පිළිගෙන අනුමත වූ පසු, එම එක් එක් අයදුම්කරුවන් සාමාජිකයන් ලෙස පිළිගෙන දැනුම් දෙනු ලැබේ. එවිට අදාළ සාමාජිකයා විසින් තම ලියාපදිංචි වීමේ ගාස්තුවත් වාර්ෂික සාමාජික මුදලත් පක්ෂ ශාඛාවට ගෙවිය යුතුය. ඉන් පසු ඔහුට හෝ ඇයට පක්ෂ සාමාජික කාඩ් පත හා සාමාජික අංක නිකුත් කරනු ලැබේ.

2026/01/19

සරත් විජේසිරි
ප්‍රධාන ලේකම්
ජාතික නිදහස් පෙරමුණ
අංක 428/1,
රොබට් ගුණවර්ධන මාවත
බත්තරමුල්ල

03.) වෙනත් පක්ෂයක නායකත්ව මට්ටමේ හා රාජ්‍ය බලය හසුරුවන මට්ටමේ සිටි අය හා සිටින අය පක්ෂයට බැඳීමට ඉල්ලුම් කළ විට ඒ ගැන තීරණ ගත හැක්කේ පක්ෂයේ මධ්‍යම කමිටුවට පමණි.

04.) වෙනත් පක්ෂයක සාමාජිකත්වය දරන අතර එක විට ජාතික නිදහස් පෙරමුණෙහි සාමාජිකත්වය දැරිය හැක. එහෙත් එසේ කළ හැක්කේ එම එක් එක් සාමාජිකයාට එසේ වෙනත් පක්ෂයක සාමාජිකත්වය දැරීමට ඉඩ දිය යුතු බව මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ පසුව පමණකි.

05.) ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන ශ්‍රී ලාංකිකයන්ට ද පක්ෂයේ සාමාජිකත්වය ලබාගත හැක. එසේ සාමාජිකත්වය ලබාගත හැක්කේ නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත ප්‍රධාන ලේකම්වරයා මගින් පක්ෂයේ මධ්‍යම කමිටුවට ඉදිරිපත් කළ පසුව එය එහිදී පිළිගෙන අනුමත කර දැනුම් දුන් පසුවය.

06.) පක්ෂයෙන් නෙරපා හරින ලද සාමාජිකයන් හෝ කලින් පක්ෂය හැර දමා යන ලද සාමාජිකයන් නැවත බඳවා ගත හැක්කේ මධ්‍යම කට්ටුවේ අනුමැතියට යටත්ව පමණි.

07.) පක්ෂ සාමාජිකත්වය ඉල්ලා සිටින ඕනෑම අයෙකුගේ සද් චේතනාව පිළිබඳ ප්‍රශ්නයක් මතුව ඇති විට සාමාජිකත්වය දීම ප්‍රතික්ෂේප කිරීමට මධ්‍යම කමිටුවට බලය ඇත.

08.) පක්ෂයට බැදෙන සෑම සාමාජිකයෙක්ම පහත සඳහන් දිවුරුමට අත්සන් කළ යුතුය.

**"මම පක්ෂයේ පොදු වැඩ පිළිවෙලට එකඟ වෙමි. එහි අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියා කරමි. පක්ෂයේ ප්‍රතිපත්තිවලට, වැඩ පිළිවෙළට හා ව්‍යවස්ථාවට අනුකූල වෙමි. පක්ෂය තුළ විචාරශීලීව හා සක්‍රියව කටයුතු කරමි. පක්ෂයට අවංක වෙමි. එහි තීරණයන් ක්‍රියාවට නඟමි."**

ඉහත සඳහන් දිවුරුම ආරක්ෂා කිරීම පක්ෂ සාමාජිකත්වයේ වගකීමක් වන අතර එකී දිවුරුම කඩ කිරීම පක්ෂයේ විනය කඩ කිරීමක් ලෙස සැලකිය යුතුය. ඒ සම්බන්ධයෙන් පක්ෂයේ මධ්‍යම කාරක සභාවට දැනුම් දීම අදාළ ශාඛාව හෝ ආයතනය විසින් සිදු කළ යුතුය.

09.) පක්ෂයෙන් ඉල්ලා අස්වීමට කැමති සාමාජිකයන් පක්ෂ ශාඛාවට ඒ බව ලිඛිතව දැන්විය යුතුය. එවිට ඔහුගේ හෝ ඇයගේ නම පක්ෂ සාමාජිකත්ව ලැයිස්තුවෙන් ඉවත් කරනු ලැබේ. දේශපාලන



සරත් විජේසිරි
ප්‍රධාන ලේකම්
ජාතික නිදහස් පෙරමුණ
අංක 428/1,
රොබට් ගුණවර්ධන මාවත
බත්තරමුල්ල

2026/01/19

හේතුන් උඩ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වන්නට ඉදිරිපත්වන ඇතැම් විට හා පක්ෂ විනය දැඩි ලෙස උල්ලංඝණය කර එසේ ඉල්ලා ඇති විට ඉල්ලා අස්වීම ප්‍රතික්ෂේප කර ඔහු හෝ ඇය පක්ෂයෙන් නෙරපා හැරීමට මධ්‍යම කමිටුවට බලය ඇත.

03 වන වගන්තිය

පක්ෂ ව්‍යුහය

**පක්ෂ ව්‍යුහය පදනම් වී ඇත්තේ ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතභාවය යටතේ වන අතර, ඒ අනුව,**

01. පක්ෂයේ සියලුම ආයතනයන් හා නායකත්වයන් ඡන්දයෙන් තෝරා පත්කරගනු ලැබේ.

02. සුළුතරය බහුතරයට අවනත වනු ලැබේ. එහෙත් නිශ්චිත කාරණයක් සම්බන්ධව සුළුතරය වන සාමාජිකයකුට හෝ සාමාජිකයන්ට එම කාරණය පිළිබඳ තම අදහසෙහි නිරවද්‍යතාවය තමන් අයත් පක්ෂ ආයතනය තුළ අවශ්‍ය විටෙක නැවත සාකච්ඡා කිරීමේ හා ඒත්තු ගැන්වීමේ අයිතියද ඇත. එම නිරවද්‍යතාවය තම පක්ෂ ආයතනය තුළ තමන් විසින් ඒත්තු ගන්වා එය බහුතර මතය ලෙස පිළිගන්නා තෙක්, ආයතනය තුළ වන බහුතර මතය පිළිගැනීමට සෑම සාමාජිකයෙකුම බැඳී සිටිය යුතුය. තමන් පක්ෂයේ සාමාජිකයකු වන තාක් බහුතරයේ මතය පක්ෂයෙන් පිටතදී විවේචනය නොකළ යුතුය.

03. ඉහළ ආයතනවල තීරණයන්ට පහළ ආයතන අවනත වනු ලැබේ. ඉහත අංක 2 හි අඩංගු මූලික අදහස් මෙම වගන්තියට ද අදාළ වේ.

04. පුද්ගලයා සාමූහිකත්වයට අවනත වනු ලැබේ. සෑම මට්ටමකම නිලයන් හා වගකීම් දරන සාමාජිකයන් තමන් අයත් පක්ෂ ආයතනයේ සාමූහික තීන්දු වලට අනුව පමණක් හැමවිටම ක්‍රියා කළ යුතුය. පක්ෂ සාමාජිකයා තමන් තුළ වන නව නිර්මාණශීලී අදහස් හා යෝජනා තමන්ගේ පක්ෂ ආයතනය තුළ සම්මත කර ගැනීමෙන් තොරව ස්වාධීනව ක්‍රියාත්මක නොකළ යුතුය.

05. පක්ෂයේ තීරණයන් පක්ෂයේ පහළ සිට ඉහළට යොමු කරනු ලබන. එහි පහළ සංවිධානවල, ශාඛාවල, ආයතනවල හා තනි තනි සාමාජිකයන්ගේ අදහස් හා යෝජනා මත පදනම් වෙමින්



2026/01/19

සරත් විජේසිරි
ප්‍රධාන ලේකම්
ජාතික නිදහස් පෙරමුණ
අංක 428/1,
රොබට් ගුණවර්ධන මාවත
බත්තරමුල්ල

විද්‍යාත්මක තක්සේරු කිරීම මත නිර්මාණය කර ගන්නා තීරණ බවට ඉහළ ආයතනයන් තුළ පූර්ණ වගවීමක් තිබිය යුතුය.

06. සෑම පහළ සංවිධානයක්ම, ශාඛාවක්ම හා ආයතනයක්ම සිය වැඩ කටයුතු පිළිබඳව ඉහළ සංවිධාන වලට නිති පතා වාර්තා කරන අතර ඉහළ සංවිධාන වලින් උපදෙස්, මෙහෙය වීම හා පක්ෂ තීරණයන් ලබාගනී.

07. සෑම සංවිධානයකම, ශාඛාවකම සහ ආයතනයකම සමාලෝචනයන් සිදු කරනු ලැබේ. එමෙන්ම ඒ තුළ නිශ්චිත කාරණා පිළිබඳ විවෘත සාකච්ඡා පවත්වනු ලැබේ.

08. සෑම ආකාරයක කට්ටිවාදී වැඩ කටයුතු සහ කණ්ඩායම් ගොඩනැගීම් නොකළ යුතු කටයුතු වේ.

## 04 වන වගන්තිය

### පක්ෂ සංවිධාන ව්‍යුහය

01. පක්ෂයේ උත්තරීතර ආයතනය ජාතික මහා සම්මේලනයයි.

02. වසර තුනකට වරක් හෝ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන ඕනෑම අවස්ථාවක පක්ෂ, ජාතික මහා සමුළුවක් පවත්වනු ලැබේ.

03. විශේෂ සමුළුවාර පැවැත්වීම, මධ්‍යම කමිටුව එවැන්නක් අවශ්‍ය යැයි අදහස් කළ විට හෝ දිසා සභා අතුරින් බහුතරයක් විසින් එය ඉල්ලා සිටිවිට හෝ ආසන සභා අතුරින් බහුතරයක් විසින් එය ඉල්ලා සිටිවිට හෝ ශාඛා සමිති අතරින් බහුතරය ඉල්ලා සිටිවිට හෝ පක්ෂ සාමාජිකත්වයෙන් 1/3 ක් එය ඉල්ලා සිටිවිට කරනු ලැබේ.

04. ජාතික මහා සම්මේලනයේදී පක්ෂයට නව මධ්‍යම කාරක සභාවක් තෝරා පත්කළ යුතුය.

05. පක්ෂ සමුළුව පවත්වන ස්ථානය, දිනය හා වේලාවත්, සමුළුවේ න්‍යාය පත්‍රයත්, එයට ඉදිරිපත් කරන ලියකියවිලිත් අවසාන වශයෙන් තීරණය කරන්නේ පවතින මධ්‍යම කාරක සභාව විසිනි. එහෙත්



2026 | 01 | 19

සරත් විජේසිරි
ප්‍රධාන ලේකම්
ජාතික නිදහස් පෙරමුණ
අංක 428/1,
රොබට් ගුණවර්ධන මාවත
බත්තරමුල්ල

විශේෂයෙන්, සමුළුවට ඉදිරිපත් කරන ලියකියවිලි පිළිබඳ යෝජනා හා අදහස් ද වෙනත් ස්ථාවර ලියකියවිලි වන ප්‍රතිපත්ති ප්‍රකාශනය, පක්ෂ වැඩ පිළිවෙළ හා පක්ෂ ව්‍යාවස්ථාව පිළිබඳව නව යෝජනා සහ අදහස්ද සියලු පක්ෂ ආයතන, සංවිධාන, ශාඛා සහ සාමාජිකත්වයන් වෙතින් නිශ්චිත සාධාරණ කාලයක් තුළදී ලබා ගැනීමට මධ්‍යම කාරක සභාව කටයුතු කළ යුතුය.

06. ජාතික මහ සමුළුවේ සහ විශේෂ සමුළුවල සාමාජිකත්වය හිමි වනුයේ අවම තරමින් වසර දෙකක කාලයක් අඛණ්ඩව පක්ෂයේ සාමාජිකත්වය ලබා ඇති අයට පමණි.

- **මධ්‍යම කාරක සභාව**

07. සමුළුව පත්කර ගතයුතු නව මධ්‍යම කාරක සභාව සඳහා මූලික නාම යෝජනා ඉදිරිපත් කිරීමේ අයිතිය ඇත්තේ පක්ෂයේ ද්විතීයික සංවිධාන, දිසා සභා සහ දේශපාලන මණ්ඩලය යන සංවිධාන වලටය. පක්ෂ ආයතන සහ දිසා සංවිධානවලින් අවම වශයෙන් එක් නාම යෝජනාවක් ඉදිරිපත් කළ යුතු අතර, ඒ ඒ දිසා සභාවලට හා ආයතනවලට ඉදිරිපත් කළ හැකි නාමයෝජනා ගණන තීරණය කරනු ලබන්නේ පවතින දේශපාලන මණ්ඩලය විසිනි. සම්පූර්ණ නාමයෝජනා සංඛ්‍යාවෙන් 1/3ක ප්‍රමාණයක් දක්වා වූ නාමයෝජනා සංඛ්‍යාවක් දේශපාලන මණ්ඩලය විසින් ඍජුව ඉදිරිපත් කළ හැක.

08. මධ්‍යම කාරක සභාව සඳහා අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, පත්වන එම මධ්‍යම කාරක සභාව සමුළුව ඉදිරියේ ප්‍රකාශයට පත් කළ යුතුය. මධ්‍යම කාරක සභාවෙ ගණ පූරණය නොපැමිණි සාමාජිකයන්ද ඇතුළු සාමාජිකයන්ගෙන් 1/3කට ආසන්න ඉහළ පූර්ණ සංඛ්‍යාව වේ.

09. සමුළුවාර දෙකක් අතරතුර පක්ෂයේ ඉහළම බලය හොබවනුයේ මධ්‍යම කමිටුවයි. පක්ෂ ව්‍යවස්ථාව ක්‍රියාවට නැගීමත් සමුළුවේදී ගන්නා ලද තීරණයන් ක්‍රියාවට නැගීමත් පක්ෂයේ ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළ මත පදනම්ව දෛනික, කෙටිකාලීන හා දිගුකාලීන උපක්‍රම හා ක්‍රියාමාර්ග තීන්දු කිරීමත්, ඒවා ක්‍රියාවට නැගීමත් මෙහි වෙනත් ස්ථානවල සඳහන් කාර්යයන්ද මධ්‍යම කාරක සභාව විසින් ඉටු කරනු ලැබේ.

10. මැතිවරණ වලදී එම එක් එක් මැතිවරණ වලට අදාළව පක්ෂ ශාඛා සමිති, ආසන සභා දිස්ත්‍රික් සභා සහ වෙනත් පක්ෂ ආයතන වලින් තෝරා මධ්‍යම කාරක සභාව වෙත යොමු කරන නාමයෝජනා මතපදනම්ව මැතිවරණ සඳහා නාමයෝජනා ඉදිරිපත් කිරීම මධ්‍යම කාරක සභාවේ වගකීමකි.



සරත් විජේසිරි
ප්‍රධාන ලේකම්
ජාතික නිදහස් පෙරමුණ
අංක 428/1,
රොබට් ගුණවර්ධන මාවත
බත්තරමුල්ල

2026/01/19

11. විධිමත් විනය ක්‍රියාමාර්ග හරහා යම්කිසි මධ්‍යම කමිටු සාමාජිකයකු ඉන් නෙරපා හැරීමට විනය කමිටුවක් විසින් තිරණය කළ විට ඇතිවන පුරප්පාඩු පිරවීමට එයට බලය ඇත.

- **දේශපාලන මණ්ඩලය**

12. මධ්‍යම කාරක සභාව විසින් එහි සාමාජිකයන් අතරින් දේශපාලන මණ්ඩලය පත්කර ගනී.

13. දේශපාලන මණ්ඩලය, මධ්‍යම කාරක සභාවේ සැසිවාර දෙකක් අතරදී මධ්‍යම කාරක සභාවට අයත් වැඩ කටයුතු කරන අතර එයට අයිති බලතල හොබවයි. දේශපාලන හා සංවිධාන තීරණ ගැනී. ඒවා ක්‍රියාවට නැගයි.

- **නිලධාරී මණ්ඩලය**

14. සභාපති, ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික සහ ජාතික සංවිධායක ඇතුළු නිලධාරී මණ්ඩලය මධ්‍යම කාරක සභාව විසින් පත් කළ යුතු අතර ඉහත තනතුරු සඳහා පත් කිරීමේදී දේශපාලන මණ්ඩලයට පත්කළ සාමාජිකයන් අතරින් එකී පත් කිරීම් සිදු කළ යුතුය. තවද මධ්‍යම කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන වෙනත් තනතුරු ඇතිකර ඊට අදාළ නිලධාරීන් මධ්‍යම කාරක සභා සාමාජිකත්වය හා/ හෝ දේශපාලන මණ්ඩලය සාමාජිකත්වය අතුරින් පත්කළ යුතුය.

- **සභාපති**

15. පක්ෂයේ සභාපතිවරයා පක්ෂයේ නායකයා වේ.

එමෙන්ම දේශපාලන මණ්ඩලයේ, මධ්‍යම කාරක සභාවේ සහ පක්ෂයේ වෙනත් මූලික සංවිධානයන් හිදී මුලසුන දැරීම හා පක්ෂය වෙනුවෙන් බාහිර ආයතන, සංවිධාන හා පුද්ගලයන් සමඟ දේශපාලන



2026/01/19

සරත් විජේසිරි
ප්‍රධාන ලේකම්
ජාතික නිදහස් පෙරමුණ
අංක 428/1,
රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල.

බලමණ්ඩලයේ හා හෝ මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතිව නිල සන්නි වේදනය පවත්වාගෙන යෑම සභාපතිවරයාගේ වගකීම වේ.

- **ප්‍රධාන ලේකම්**

16. පක්ෂයේ සියලු සංවිධාන කැදවීම හා අධීක්ෂණය, පක්ෂයේ නිල ප්‍රකාශ නිකුත් කිරීම හා වාර්තා තබා ගැනීම, පක්ෂයේ නියෝග නිකුත් කිරීම ප්‍රධාන ලේකම්වරයාගේ වගකීමය.

- **ජාතික සංවිධායක**

17. ජාතික වැදගත්කමින් යුක්ත වූ කරුණු කෙරෙහි අධ්‍යයනය කර පක්ෂය හා සම්බන්ධීකරණයෙන් ජාතික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ පක්ෂයේ කණිෂ්ඨ සංවිධාන ගොඩ නැගීම, අධීක්ෂණය හා මෙහෙය වීමට නායකත්වය දීම ජාතික සංවිධායකවරයාගේ වගකීමයි.

- **භාණ්ඩාගාරික**

18. පක්ෂයේ ව්‍යවස්ථාවට අනුකූලව මුදල් පරිහරණය කිරීම, වාර්තා සැපයීම භාණ්ඩාගාරික සතු වග කීමකි.

- **දිසා සභාව**

19. පක්ෂයේ ආසන සභා වල සභාපති, ලේකම් දිස්ත්‍රික්කයට අදාළ ද්වීතික සංවිධාන වල නියෝජිතයන්ගෙන් සැදුම් ලත් ආයතනයක් වන දිසා සභාවේ සභාපතිවරයා දිසා සමුළුවේ ඡන්දයෙන් පත්වන අතර සභාපතිවරයා දිසා නායකයාද වේ.



2026/01/19

සරත් විජේසිරි
ප්‍රධාන ලේකම්
ජාතික නිදහස් පෙරමුණ
අංක 428/1,
රොබට් ගුණවර්ධන මාවත
බත්තරමුල්ල

20. දිසා ලේකම්වරයා මධ්‍යම කාරක සභාව මගින් නම් කරනු ලබන අතර සෙසු නිලධාරීන් දිසා සමුළුවේදී ඡන්දයෙන් තෝරාපත් කරගනී.

- **ආසන සභාව**

21. පක්ෂයේ ශාඛා සමිති වල සභාපති හා ලේකම්ගෙන් සහ ආසනයට අදාල ද්විතික සංවිධාන වල නියෝජිතයන්ගෙන් සැදුම්ලත් ආයතනයක් වන ආසන සභාවේ සභාපති ඇතුළු නිලධාරී මණ්ඩලය (ආසන ලේකම් හැර) ආසන සමුළුවේදී ඡන්දයෙන් තෝරාපත් කරගත යුතුය.

22. ආසන ලේකම්වරයා දිසා සභාව විසින් පත්කරනු ලැබේ.

- **ශාඛා සමිතිය**

23. පක්ෂයේ මූලිකම සංවිධානය ශාඛා සමිතිය වේ. ඡන්ද මධ්‍යස්ථානයකට එක් ශබා සමිතියක් වශයෙන් සකසන ශාඛා සමිති අවස්ථාවෝචිත පරිදි සුදුසු නිලධාරී මණ්ඩලයක් පත්කරගත යුතු අතර ශාඛා සමිති කැඳවීම දිසා නායක හා/හෝ දිසා ලේකම්ගේ උපදෙස් පරිදි, ආසන සභාපති හා/ හෝ ආසන ලේකම් විසින් කළ යුතුය.

24. ඉහත කවර වගන්තියක කෙසේ සඳහන්ව තිබුණ ද ශාඛා සමිතිය, ආසන සභාව සහ දිසා සභාව පිළිවෙළින් තම ඉහළ සංවිධානය ලෙස ආසන සභාව, දිසා සභාව සහ මධ්‍යම කාරක සභාව සැලකිය යුතු අතර ඒ සංවිධානවල පැවැත්ම, කටයුතු, නිලධාරීන් හා වෙනත් කවර කරුණක් සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම හා අනුකූලව කටයුතු කිරීම එකී ඉහළ සංවිධානයේ තීරණ අනුව සිදු කළ යුතුය.

25. ඉහත සදහන් සංවිධාන ව්‍යුහයේ සිදුවන අඩුපාඩුවක් හා/හෝ මග හැරීමක් මෙම ව්‍යවස්ථාවට අදාළ කවර හෝ කාර්යයක් නිෂේධ කරන්නක් හා/හෝ අවලංගු කරන්නක් හා/හෝ බල රහිතකරන්නක් ලෙස නොසැලකිය යුතුය.



2026/01/19

සරත් විජේසිරි
ප්‍රධාන ලේකම්
ජාතික නිදහස් පෙරමුණ
අංක 428/1,
...ධ ගුණවර්ධන මාවත
බත්තරමුල්ල

05 වන වගන්තිය

**පක්ෂ විනය**

01.) පක්ෂයේ සමගිය හා ඒකමිතිකත්වය රැක ගැනීමට හා ශක්තිමත් කර ගැනීමටත් පක්ෂයේ හැකියාව හා ශක්තිය වැඩි දියුණු කර ගැනීමටත් එහි ජයග්‍රහණයෙන් රැක ගැනීම සඳහාත් නව ජයග්‍රහණයන් ලබා ගැනීම සඳහාත් පක්ෂයේ ගරුත්වය ආරක්ෂා කර ගැනීම සඳහාත් ප්‍රජාතන්ත්‍රවාදී මධ්‍යගතභාවය නිවැරදිව ක්‍රියාවට නැගීම සඳහාත් පක්ෂ විනය ඉතා වැදගත් වේ. බහු ජනතාවට නායකත්වය ලබාදීමේදී පක්ෂ විනය ඉතා වැදගත් වේ. එහෙත් අනෙක් අතට පක්ෂ විනය යනු කිසිසේත්ම නිරපේක්ෂ වූ එකක් නොවේ. එය විසින් බලාපොරොත්තු වනුයේ පක්ෂයේ ප්‍රතිපත්ති, වැඩපිළිවෙළ, ව්‍යවස්ථාව, උල්ලංඝනය නොකරන පක්ෂයේ උපක්‍රම හා ක්‍රියාමාර්ග අනුගමනය කරන වඩා සහෝදරත්වයෙන් පිරි එමෙන්ම බාහිර සමාජයට ආදරය කරන පක්ෂ සාමාජිකයන් බවට පත්වීමය. පක්ෂ සංවිධානය තුළ සහ ප්‍රසිද්ධ ජන ජීවිතය තුළ ඔහු හෝ ඇය දරන ස්ථාන සලකමින්ද වෙන් වූ වැරදි හා සිද්ධීන් මත නොව පක්ෂයට කරන ලද සමස්ත සේවාව සැලකිල්ලට ගනිමින්ද සානුකම්පිතව සැලකීමෙන් වැරදි නිවැරදි කරගැනීමට සාධාරණ අවස්ථාවක් සැලසීමෙන් ද විනය ප්‍රශ්න නිරාකරණය කරගැනීමට කටයුතු කරනු ලැබේ. එහෙත් සෘජු පක්ෂ විරෝධී බරපතල දේශපාලන වැරදි පිළිබඳව වඩා වේගවත් සහ තියුණු විනය ක්‍රියාමාර්ග අනුගමනය කරනු ඇත.

02.) පක්ෂ සාමාජිකයකු පක්ෂ විනය උල්ලංඝනය කරන බවට නිරීක්ෂණය වන විට හෝ සංවිධානයකින් හෝ ආයතනයකින් හෝ ශාඛාවකින් හෝ සාමාජිකයකුගෙන් හෝ මධ්‍යම කාරක සභාව වෙත දන්වා සිටින විට ඒ සම්බන්ධයෙන් විමසීමක් සිදුකර අවශ්‍ය වන්නේ නම් මධ්‍යම කමිටුව විසින් මධ්‍යම කමිටු සාමාජිකයන්ගෙන් සමන්විත විනය කමිටුවක් පත් කළ යුතුය. තවද එකී විමසීමෙන් පසු අවශ්‍ය යයි තීරණය කරන්නේ නම් ඉදිරි විනය ක්‍රියාමාර්ග ගන්නා තෙක් අදාළ සාමාජිකයාගේ පක්ෂ සාමාජිකත්වය තාවකාලිකව අත්හිටුවීම, ඔහු සතු පක්ෂ දේපළ යළි භාර දෙන ලෙසට නියෝග කිරීම, ඔහුගේ ක්‍රියාකාරකම් සීමාකිරීම හෝ අත්හිටුවීම මධ්‍යම කාරක සභාව විසින් සිදු කළ හැකිය.

03.) ඉහත කී විනය කමිටුව විසින්

(1) අදාළ සාමාජිකයා වෙත ලිඛිත චෝදනා පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.

2026 - 01 - 19

සරත් විජේසිරි
ප්‍රධාන ලේකම්
ජාතික නිදහස් පෙරමුණ
අංක 428/1,
රොබට් ගුණවර්ධන මාවත
බත්තරමුල්ල

(II) අදාළ සාමාජිකයාට කමිටුව හමුවේ කරුණු දැක්වීමට දින 14කට නොඅඩු කාලයක් හා අවස්ථාවක් ලබදිය යුතුය.

(III) අදාල සාමාජිකයා එම කාලය හා අවස්ථාව අත් හරින්නේනම් පමණක් ඒකපාර්ශවිකව කරුණු විභාග කල යුතුය.

(IV) විනය කමිටුව විසින් ඉදිරිපත් කරනු ලබන නිරික්ෂණ හා නිර්දේශ මධ්‍යම කාරක සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(V) එකී නිරික්ෂණ හා නිර්දේශ ශලකා බලා සුදුසු විනය නියෝග නිකුත් කිරිම මධ්‍යම කාරක සභාව විසින් කළ යුතුය.

04. නෙරපා හැරීමේ ක්‍රියා මාර්ගයට එරෙහිව පමණක් නෙරපීමේ දැන්වීම ලැබී දින 14 ක් ඇතුළතපක්ෂය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරිමට අදාළ සාමාජිකයාට අයිතිය තිබේ.

05. එකී අභියාචනය සම්බන්ධයෙන් මධ්‍යම කාරක සභාවේ තීරණය අවසානාත්මක වන අතර කිසිදු ලෙසකින් ප්‍රශ්න කළ නොහැකිය.

- **මහජන නියෝජිත ආයතන**

1.) පාර්ලිමේන්තුවට, පළාත් සභා වලට, පළාත් පාලන ආයතනවලට තේරී පත්වුන පක්ෂ සාමාජිකයන් එම ආයතන තුළ පක්ෂ කණ්ඩායමක් ලෙස සාමූහිකව කටයුතු කළ යුතුය. නියෝජිතයන් දෙදෙනෙකුට වඩා වැඩි පිරිසක් ආයතනයකට තේරී පත් වී ඇතිවිට ඒ අතරින් එක් අයකු කණ්ඩායම් නායකයා ලෙස තෝරා පත්කර ගත යුතුය.

2.) සෑම මහජන නියෝජිතයකුම තමන්ට ලැබෙන වේතන හා දීමනා වලින් පක්ෂය ඉල්ලා සිටින නිශ්චිතකොටසක් ලබා දිය යුතුය. ඒවා මහජන දේපළක් ලෙස සැලකිය යුතුය.

3.) ඔවුන් ලබන විශේෂ වරප්‍රසාද වලින් පක්ෂය ඉල්ලා සිටින නිශ්චිත කොටසක්ද පක්ෂය වෙත ලබා දීම සිදු කළ යුතුය. ඒවා මහජන දේපළක් ලෙස සැලකිය යුතුය.

2026/01/19

සරත් විජේසිරි
ප්‍රධාන ලේකම්
...නිදහස් පෙරමුණ
428/1,
... බත්තරමුල්ල

06 වන වගන්තිය

උපදේශක සභා

1.) පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කෙරෙන විෂය ක්ෂේත්‍ර පිළිබඳව උපදේශනාත්මක සේවාවන් ලබා ගැනීම සඳහා ප්‍රවීණ, ප්‍රගතිශීලී උගතුන්ගෙන් සමන්විත මණ්ඩල පිහිටවනු ලැබේ.

07 වන වගන්තිය

මුදල්

01. පක්ෂයේ සියලු මුදල් පාලනය මධ්‍යම කාරක සභාව සතු වුවද මධ්‍යම කාරක සභාවේ අනුමැතිය හා උපදෙස් මත මුදල් පරිහරණය කිරීමේ වගකීම භාණ්ඩාගාරිකට පැවරේ.

02. පක්ෂයේ නමින් මධ්‍යම කාරක සභාව තීරණය කරනු ලබන බැංකුවක ගිණුමක් මගින් මුදල් ගනුදෙනු පවත්වාගෙන යා යුතුය. පක්ෂය වෙත ලැබෙන මුදල් වලින් මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන සුළු අත් මුදල් ප්‍රමාණයට අතිරික්ත මුදල් සෑම විටම බැංකු ගිණුමේ තැන්පත් කළ යුතුය.

03. පක්ෂය වෙත ලැබෙන සෑම මුදලක් සඳහාම භාණ්ඩාගාරිකගේ හෝ ඔහු වෙනුවෙන් බලය ලත් අයකුගේ අත්සන සහිත රිසිට්ටිපතක් නිකුත් කළ යුතුය.

04. පක්ෂයේ ගිණුමෙන් මුදල් ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම්, භාණ්ඩාගාරික හා සභාපති හෝ ලේකම් විසින් චෙක්පත් වලට අත්සන් කළ යුතුය.

05. මුදල් ලැබීම හා වියදම් පිළිබඳව සියලු ලිපි ලේඛන හා වාර්තා සැකසීම හා පවත්වා ගෙන යාම භාණ්ඩාගාරික විසින් කළ යුතුය.

2026/01/19

සරත් විජේසිරි
ප්‍රධාන ලේකම්
ජාතික නිදහස් පෙරමුණ
අංක 428/1,
රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල

06. වාර්ෂික අය-වැය වාර්තාව මධ්‍යම කාරක සභාව හෝ මහා සම්මේලනය විසින් නම් කරන ලද විගණන නිලධාරියකු විසින් අනුමත කළ යුතුය.

07. ශාඛා ව්‍යාපෘති හා විශේෂ සංවිධානයන්ගේ මුදල් පරිහරණය පක්ෂයේ ප්‍රධාන භාණ්ඩාගාරිකගේ අධීක්ෂණය හා මෙහෙයවීම හා අනුමැතිය මත සිදු විය යුතුය.

**08 වන වගන්තිය**

**අතුරු ව්‍යවස්ථා සහ සංශෝධන**

01. පක්ෂ ව්‍යවස්ථාව පිළිබඳව ඕනෑම ගැටළුවක් මතු වූ විට එය අර්ථ නිරූපණය කිරීමේ වගකීම මධ්‍යම කාරක සභාව සතුය.

02. ව්‍යවස්ථාවේ සඳහන් නොවන, පැහැදිලි නොවන කාරණයක් ගැන තීරණ ගැනීමේ වගකීම මධ්‍යම කාරක සභාව සතුය.

03. අවශ්‍ය අවස්ථාවන්හිදී අතුරු ව්‍යවස්ථා හා නීති පැනවීමේ අයිතිය මධ්‍යම කාරක සභාව සතුය.

04. මෙම ව්‍යවස්ථාව මීළඟ පක්ෂ සමුළුව දක්වා කාලය තුළදී අවශ්‍ය විටෙක සංශෝධනය කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතුය.

05. පක්ෂ සාමාජිකත්වය ලැබීම ආරම්භයේදී ශාඛා නොමැතිව ක්‍රියාත්මක වීම පිළිගත හැක.

**ජාතික නිදහස් පෙරමුණ**

2026-01-19

සරත් විජේසිරි
ප්‍රධාන ලේකම්
ජාතික නිදහස් පෙරමුණ
අංක 428/1,
රොබ... ...වත
බත්...